රාජකීය විද්‍යාලය - කොළඹ 7

දෙවන වාර පරීක්ෂණය 2008 - 11 ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

කාලය පැය 1

උපදෙස්

* **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
* **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**

1. මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරීමට යොදා ගන්නේ

   1) ආහාර හා ඇඳුම් 3) නිවාස හා සෞඛ්‍යය

   2) භාණ්ඩ හා සේවා 4) ආරක්ෂාව හා භාණ්ඩ

2. මිනිස් අවශ්‍යතාවයන් ලෙස හඳුන්වන්නේ,

   1) ජීවත් වීම සඳහා මිනිසා විසින් පසු කළ යුතු අවස්ථාවන් ලෙසිනි.

   2) මූලික තෘප්තියක් ඉටුකර ගැනීම සඳහා මිනිසා තුළ ඇති පෙළිමේ ස්වභාවයක ලෙසිනි.

   3) මිනිසාගේ මානසික ක්‍රියාකාරීත්වය තුළින් පැන නගින්නක් ලෙසිනි.

   4) මිනිසා උත්පත්තියෙන් ගෙනෙන සහජ ගති ලක්ෂණයක් ලෙසිනි.

3. "නිෂ්පාදිත" යන්න වඩාත් හොඳින් පැහැදිලි කරන ප්‍රකාශය කුමක්ද?

   1) සාධක සංයොගයෙන් කෙරන නිපැයුමයි.

   2) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමක් කිරීමට ඉදිරිපත් කෙරෙන ඕනෑම දෙයකි.

   3) කර්මාන්ත ශාලා තුළ සිදුවන ක්‍රියාදවයකි.

   4) නිෂ්පාදකයෙකුගේ අවසාන ඉලක්කයයි.

4. ව්‍යාපාරයක තොරතුරු ගැන උනන්දුවක් දක්වන අභ්‍යන්තර පාර්ශව,

   1) අයිතිකරුවන්, කළමණාකරුවන්, සේවකයින්ය

   2) අයිතිකරුවන්, අනාගත ආයෝජකයෝ, සේවකයන්ය

   3) හිමිකරුවන්, බැංකු, කළමණාකරුවන්ය

   4) හිමිකරුවන්, ණයහිමියෝ, ණයගැතියන්ය

5. භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා අතට පත්කිරීමේ ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ,

   1) බෙදා හැරීම වශයෙනි 3) හුවමාරුව වශයෙනි

   2) අලෙවිකරණය වශයෙනි 4) විකුණුම්කරණය වශයෙනි

6. තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම අතර වෙනස තීරණය වන්නේ,

1) පරමාර්ථය අනුවය
2) භාණ්ඩ ප්‍රමාණය අනුවය
3) මිල අනුවය
4) වට්ටම් අනුවය

7. අලෙවිය එක් භාණ්ඩයකට හෝ දෙකකට සීමාවීම හා රටපුරා ශාඛා ව්‍යාප්ත වී තිබීම යන ලක්ෂණ ඇත්තේ,

1) නානාංග වෙළඳ සැල්ය
2) සුපිරි වෙළඳ සැල්ය
3) ආංශික වෙළඳ සැල්ය
4) සමූපකාර වෙළඳ සැල්ය

8. පහත සඳහන් ප්‍රකාශ වලින් මුදලේ කාර්යයක් නොවන්නේ,

1) විනිමය මාධ්‍යයක් වීමයි
2) විලම්භිත ගෙවුම් ක්‍රමයක් වීමයි
3) වටිනාකම පිළිබඳ මිනුමක් වීමයි
4) පොදු පිළිගැනීමයි

9. ප්‍රධානියා වෙනුවෙන් විකිණීමේ කටයුතු කිරීමේදී භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ අයිතිය හා වගකීම පවරාගෙන කටයුතු කරන්නේ,

1) කැපකරු නියෝජිතයාය
2) ප්‍රේරක නියෝජිතයාය
3) කොමිස් නියෝජිතයාය
4) සාධ්‍යකයාය

10. ව්‍යාපාරිකයා තම ගණුදෙනුකරුවන් වෙනුවෙන් ඉටුකෙරෙන පහත සඳහන් කාර්යයන්ගෙන් ව්‍යාපාර ආචාර ධර්මයක් ලෙස පිළිගත නොහැකිවන්නේ,

1) ගනුදෙනු නොරැවටීම
2) දුන් පොරොන්දු ඒ අයුරින්ම ඉටු කිරීම.
3) ගනුදෙනුකරුවන්ට ගෞරව කිරීම.
4) භාණ්ඩ හා සේවා පිළිබඳ අතිශෝක්තියෙන් වර්ණනා කිරීම.

11. ව්‍යාපාර සංවිධාන අතුරින් තීරණ ගැනීමේදී වඩාත්ම ස්වාධීන ව්‍යාපාරය වන්නේ,

1) හවුල් ව්‍යාපාරයි
2) ඒක පුද්ගල ව්‍යාපාරයි
3) පොදු සමාගමය
4) සමූපකාර සමිතිය

12. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානය වන්නේ,

1) රාජ්‍ය සංස්ථාය
2) හවුල් ව්‍යාපාරය
3) සීමාසහිත පොදු සමාගමය
4) සීමාසහිත පෞද්ගලික සමාගමය

13. අනෙක් පරිවහන ක්‍රමවලට වඩා දුම්රිය පරිවහනයේ ඇති විශේෂ වාසියක් වන්නේ,

1) නියමිත කාලසටහනකට අනුව ධාවනය වීම.

2) භාණ්ඩ වල ප්‍රවේශම ගැන විශ්වාසය තැබිය හැකිවීම.

3) ඕනෑම ස්ථානයකදී භාණ්ඩ පැටවීම හා බෑමට හැකිවීම.

4) වෙනත් පරිවහන ක්‍රමයන්ට සාපේක්ෂව පිරිවැය අඩුවීම.

14. රක්ෂණයේදී හානිය යථා තත්වයට පත් කිරීමට ප්‍රමාණවත් වන්දියක් පමණක් ගෙවන මූලධර්මය,

1) රක්ෂණ හිමිකමයි

2) උපරිම විශ්වාසයයි

3) ආදේශනයයි

4) හානිපූර්ණය

15. ඇසුරන ලද ආහාර ද්‍රව්‍යයක් මිලදී ගැනීමේදී පාරිභෝගිකයා සලකා බැලිය යුත්තේ,

1) මිල, ස්ථානය, කාලය හා පිරිවැය

2) ස්ථානය, කාලය, යෝග්‍යතාව හා පිරිවැය

3) මිල, කල් ඉකුත්වන දිනය, ප්‍රමාණය හා අඩංගු ද්‍රව්‍ය

4) යෝග්‍යතාවය, මිල, ස්ථානය හා කාලය

16. මූල්‍ය සේවා සපයන බැංකු නොවන මූල්‍ය ආයතන පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1) කල්බදු සමාගම්, වාණිජ බැංකු, මූල්‍ය සමාගම්

2) කල්බදු සමාගම්, මූල්‍ය සමාගම්, මහජන බැංකුව

3) කල්බදු සමාගම්, ප්‍රාග්ධන ව්‍යවසායකත්ව සමාගම්, මූල්‍ය සමාගම්

4) කල්බදු සමාගම්, වාණිජ බැංකු, වණික් බැංකු

17. වණික් බැංකු මගින් ලබාගත හැකි සේවාවක් නොවන්නේ,

1) ජංගම ගිණුම් පවත්වාගෙන යාම

2) කල්බදු සේවා

3) ව්‍යාපෘති වාර්තා සකස් කරදීම.

4) කළමණාකරණ උපදේශක සේවා සැපයීම

18. බලපත්‍ර ලාභී වානිජ බැංකුවක් වන්නේ,

1) ලංකා බැංකුව

2) ජාතික ඉතිරි කිරීමේ බැංකුව

3) මූල්‍ය සමාගම්

4) ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව

19. අවිධිමත් දිගුකාලීන ආයෝජන මාර්ගයක් ලෙස සලකනු ලබන්නේ,

1) භාණ්ඩාගාර බැඳුම්කර

2) ස්වර්ණාභරණවල ආයෝජනය

3) කොටස් හා ණයකර

4) භාණ්ඩාගාර බිල්පත්

20. නිෂ්පාදකයෙකුට සිය නිෂ්පාදිතයේ ගුණත්වය පෙන්නුම් කිරීම සඳහා උපයෝගි කරගත හැකි ක්‍රියා මාර්ගයකි.

1) ප්‍රචාරණය
2) ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය ලබාගැනීම
3) ඇසුරුම් භාවිතා කිරීම
4) නවීන ඇසුරුම් ක්‍රම භාවිතා කිරීම

21. වඩාත් නිවැරදි අවසාන ගිණුම්කරණ සමීකරණය වනුයේ

1) ප්‍රාග්ධනය + වියදම + වගකීම = වත්කම් + ආදායම
2) ප්‍රාග්ධනය + වත්කම් + වගකීම = ආදායම + වියදම
3) ප්‍රාග්ධනය + ආදායම + වත්කම් = වගකීම + වියදම
4) ප්‍රාග්ධනය + ආදායම - වියදම + වගකීම = වත්කම්

22. වත්කම්, වගකීම, ආදායම්, වියදම් හා ප්‍රාග්ධනය පිළිබඳ සාරාංශයක් එකවර ලබාගත හැක්කේ.

1) ලාභා'ලාභ ගිණුම මගින්
2) මුදල් පොත මගින්
3) ශේෂ පත්‍රය මගින්
4) ශේෂ පිරික්සුම මගින්

23. පහත දැක්වෙන ගනුදෙනුවලින් ගිණුම් පොත් වලට සටහන් නොකරන ගනුදෙනුව හෝ සිද්ධිය වන්නේ,

1) විදුලි ගාස්තු ගෙව්වා රු. 500/- යි.
2) සේවක වැටුප් ගෙව්වා රු. 1500/- යි.
3) දැකුම්කළු පරිසරයක ව්‍යාපාරය පිහිටුවා තිබීම.
4) දක්ෂ කළමණාකරවෙකුගේ වේතනය ගෙව්වා රු. 5500/- යි.

24. ගැණුම් ජ'නලයේ එකතුව ඇතුළත් කරනුයේ,

1) ගැණුම් ජ'නලයේ හරටය
2) ගැණුම් ගිණුමේ හරටය
3) විකුණුම් ජ'නලයේ බැරටය
4) විකුණුම් ගිණුමේ බැරටය

25. මුදල් පොතේ ගෙවීම් පැත්තේ වට්ටම් තීරුවෙන් දැක්වෙන්නේ,

1) ලැබූ කොමිස් වේ.
2) ලැබූ වට්ටම් වේ.
3) දුන් කොමිස් වේ.
4) දුන් වට්ටම් වේ.

26. හිමිකරුගේ මුදල් ගැනිලි වලට අදල වඩාත් නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1) ප්‍රාග්ධන ගිණුම හර, මුදල් ගිණුම බැර
2) ගැනිලි ගිණුම හර, ගැණුම් ගිණුම බැර
3) ගැනිලි ගිණුම හර, මුදල් ගිණුම බැර
4) ගැනිලි ගිණුම හර, මුදල් ගිණුම හර

27. බැංකුවේ මුදල් තැන්පත් කළ චෙක්පතක් අගරුවීමට අදල සටහන වන්නේ,

1) අගරු චෙක්පත් ගිණුම බැර, බැංකුව තීරුව හර

2) අගරු චෙක්පත් ගිණුම බැර, මුදල් තීරුව හර

3) අගරු චෙක්පත් ගිණුම හර, බැංකුව තීරුව බැර

4) අගරු චෙක්පත් ගිණුම හර, මුදල් තීරුව බැර

28. අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ බැංකුණය ගෙවීමට අදල ද්විත්ව සටහන වනුයේ,

1) බැංකු ණය ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර

2) බැංකු ණය ගිණුම හර, මුදල් ගිණුම බැර

3) බැංකු ණය ගිණුම හර, ගැනිලි ගිණුම බැර

4) ගැනිලි ගිණුම හර, බැංකු ණය ගිණුම බැර

29. ව්‍යාපාරයේ මුළු වත්කම් වල වෙනසක් ඇති නොවන ගනුදෙනුව වනුයේ,

1) ව්‍යාපාරය නැවත විකිණීමේ පරමාර්ථයෙන් අත්පිට මුදලට තොගයක් ගත්තා රු.10,000/-

2) අයිතිකරු ප්‍රාග්ධනය ලෙස රු 50,000/- ක් වටිනා රථය ව්‍යාපායට යෙදීම.

3) ව්‍යාපාරය සඳහා බැංකු ණයක් ලබාගෙන ගොඩනැගිල්ලක් ගැනීම රු. 70,000/-

4) අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ව්‍යාපාරයට යන්ත්‍රයක් මිලට ගත්තා රු. 20,000/-

*** ව්‍යාපාරයක 2007.12.31 දිනට මුදල් පොතට අනුව බැංකු ශේෂය 5100 කි. 2007 දෙසැ. මාසය තුළදී නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 2600 ක්ද, තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් 4500/-ක්ද මුදල් පොතේ සටහන් නොවූ ස්ථාවර නියෝග රු. 200/- ක්ද ණයගැති ප්‍රේශන 1300 ක්ද තිබේ.

ඉහත ව්‍යාපාරයේ තොරතුරු ඇසුරෙන් 30, 31 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

30. මෙම ව්‍යාපාරයේ 2007.12.31 දිනට සංශෝධිත මුදල් පොතට අනුව බැංකු ශේෂය

1) 6400 2) 6200 3) 3200 4) 4300

31. මෙම ව්‍යාපාරයේ 2007.12.31 දිනට බැංකු ගිණුම් විස්තරයේ පැවති බැංකු ශේෂය වන්නේ,

1) 3200 2) 4300 3) 6400 4) 6200

32. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයට අදල පිරිවැයෙහි මූලිකාංග

1) වක්‍ර ද්‍රව්‍ය, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය, වක්‍ර වෙනත්

2) වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රම, ඍජු ද්‍රව්‍ය

3) වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර , ශ්‍රම වක්‍ර වෙනත්

4) වක්‍ර ද්‍රව්‍ය, ඍජු ශ්‍රම, ඍජු වෙනත

33. විකුණුම් වල වටිනාකම ගණනය කරන ප්‍රකාශය වන්නේ.

1) විකුණුම් පිරිවැය + දළ අලාභය

2) විකුණුම් පිරිවැය + ශුද්ධ ලාභය

3) විකුණුම් පිරිවැය + දළ ලාභය

4) විකුණුම් පිරිවැය + ශුද්ධ අලාභය

34. වෙළඳ හා ලාභ'ලාභ ගිණුම පිළියෙල කිරීමෙන් පසුව, ශේෂ පිරික්සුමේ ඉතිරිවන ගිණුම් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1) වියදම්, වත්කම්, ආදායම්
2) ප්‍රාග්ධනය, වගකීම්, ආදායම්
3) ප්‍රාග්ධනය, වගකීම්, වත්කම්
4) ප්‍රාග්ධනය, වගකීම්, වියදම්

35. පහත් සඳහන් ගිණුම්කරණ වැරදි අතුරින් ශේෂ පිරික්සුමේ එකතුව කෙරෙහි බලනොපාන වරද වන්නේ,

1) ලිපි ද්‍රව්‍ය රු. 200/- ක් එම ගිණුමට පිටපත් වී නොතිබීම.

2) ප්‍රචාරණ ගාස්තු ගිණුමේ රු 100/- ක් අඩුවෙන් එකතු කිරිම.

3) අත්පිට ගිණුම් රු. 500/- පොත්වල සටහන් නොවීම.

4) ලද ගෙවල් රු. 1800/- ගෙවූ ගෙවල් කුළී ගිණුමේ හරට පිටපත් කර ඇත.

36. ආයතන හා පරිපාලන වියදම් පමණක් ඇතුලත් කාණ්ඩය වනුයේ,

1) ගෙවල් කුලි, විදුලි, රක්‍ෂණ, වේතන
2) ගෙවල් කුලි, ප්‍රචාරණ, විදුලිය, වේතන
3) ගෙවල් කුලි, බැංකු ගාස්තු, රක්‍ෂණ
4) ගෙවල් කුලි, වරිපනම්, පොලි

37. වෙළඳ හා ලාභ'ලාභ ගිණුම පිළියෙල කරන විට, ලෙජරයේ ඇති ගිණුම් වලින් පියවී යන ගිණුම් පමණක් ඇති කාණ්ඩය තෝරන්න.

1) ආදායම් හා වියදම් ගිණුම්ය
2) වත්කම් හා වියදම් ගිණුම්ය
3) ආදායම් හා වත්කම් ගිණුම්ය
4) වියදම් හා වගකීම් ගිණුම්ය

*** සිසිර ව්‍යාපාරයේ අග්‍රිම ක්‍රමයට සුළු මුදල් පොත පවත්වා ගෙන යයි. 2008.05.01 දින සුළු මුදල් භාරකරු අත රු.100/- ක් ඉතිරිව තිබුණු අතර එදිනම රු. 900/- ක් ලබා ගෙන අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන ලදී. මැයි මාසය තුළ රු. 800/- ක් දක්වා සුළු වියදම් ගෙවා තිබූ අතර 2008.06.01 දින නැවත අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන ලදී.

ඉහත තොරතුරු ඇසුරෙන් 38, 39, 40 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

38. සිසිර ව්‍යාපාරයේ සෑම මාසයකම පවත්වාගෙන යන සුළු මුදල් අග්‍රිමය කොපමණද?

1) 100/- 2) 1000/- 3) 900/- 4) 800/-

39. 2008.05.31 දිනට සුළු මුදල් භාරකරුගේ අත ඉතිරිය කොපමණද?

1) 100/- 2) 200/- 3) 750/- 4) 900/-

40. 2008.06.01 දින සුළු මුදල් භාරකරු ප්‍රතිපූර්ණය කරන ලද මුදල කීයද?

1) 900/- 2) 800/- 3) 100/- 4) 200/-

රාජකීය විද්‍යාලය - කොළඹ 7

දෙවන වාර පරීක්ෂණය 2008 - 11 ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

කාලය පැය 3

උපදෙස්

*** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට (5) පමණක් පිළිතුරු ලියන්න.**

*** පළමුවන ප්‍රශ්නය ඇතුළුව 1 කොටසින් ප්‍රශ්න 2ක්ද 11 කොටසින් ප්‍රශ්න 2ක්ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. භාණ්ඩ හුවමාරු ක්‍රමය තුළ ඇති වූ දුෂ්කරතා 2ක් පැහැදිලි කරන්න.

ii. එකිනෙකාගේ වුවමනාවන් වෙනස් වීමට හේතු 2ක් සඳහන් කරන්න.

iii. රජයේ ආර්ථික ප්‍රතිපත්ති සෘජුවම ව්‍යාපාරවලට බලපායි. නිදසුන් 2ක් දෙන්න.

iv. පොදු ජ'නලයේ ඇතුලත් කරන සටහන් වර්ග 4ක් සඳහන් කරන්න.

v. ජංගම ගිණුමක් පවත්වා ගෙන යාමෙන් ව්‍යාපාරිකයාට ඇති ප්‍රයෝජන 4ක් ලියන්න.

vi. පහත දැක්වෙන මූලික පොත් වලට අදාල මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

අ. සුළු මුදල් පොත

ආ. පොදු ජ' නලය

vii. අයිතිකරුවන්ගේ වගකීම සීමාරහිත ව්‍යාපාර වර්ග 2ක් නම් කරන්න.

viii. ගිණුම්කරණයේදී දැකිය හැකි දෝෂ වර්ග 2ක් සඳහන් කරන්න.

ix. සෘජු පිරිවැයෙහි මූලිකාංග නම් කරන්න.

x. විකුණුම් පිරිවැය ගණනය කිරීමට ඇතුළත් කරන දත්තයන් 2ක් සඳහන් කරන්න.

(ලකුණු 2 X 10 = 20)

1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

(02) i. "ව්‍යවසායකත්වය" යන්න හඳුන්වා, හොඳ ව්‍යවසායකයෙකු සතු ගුණාංග 4ක් සඳහන් කරන්න.

ii. ව්‍යවසායකත්වය දියුණු කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග 2ක් සඳහන් කරන්න.

iii. "ව්‍යවසායකත්වය" සමාජයට සලසන යහපත කවරේද?

iv. සමාගම් සම්බන්ධයෙන් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පනත සඳහන් කර, ඒ යටතේ ලියාපදිංචි කරන ව්‍යාපාර සංවිධාන 2ක් නම් කරන්න.

v. සමූපකාර සමිතියක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියවිලි 4ක් සඳහන් කරන්න.

(ලකුණු 2 X 5 = 10)

(03) i. ඉතිරි කිරීම් හා ආයෝජන යන පද කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ඉතිරි කිරීම් ක්‍රම 2ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. කොළඹ කොටස් හුවමාරුව ඉටු කරන කාර්යයන් 2ක් ලියන්න.

iv. සාමාන්‍ය කොටස් හා ණයකර අතර වෙනස්කම් 4ක් සඳහන් කරන්න.

v. වාණිජ බැංකු හඳුන්වා, එම බැංකුව සපයන වෙනත් සේවා 2ක් ලියන්න.

(ලකුණු 2 X 5 = 10)

(04) i. භාණ්ඩ යන්න හඳුන්වා, එහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ 2ක් ලියන්න.

ii. විකල්ප බල ශක්තීන් 2ක් සඳහන් කරන්න.

iii. භාණ්ඩ හා සේවා වල ස්වභාවය අනුව වෙළෙඳ පොළ වර්ග කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iv. විවිධ විකුණුම් ක්‍රම ක්‍රියාත්මක වීමට හේතු 2ක් සඳහන් කර, අත්පිට විකිණීම කෙටියෙන් පැහැදිලි කරන්න.

v. අපනයන වෙළෙඳාම හඳුන්වා, අපනයන දිරි ගැන්වීමට රජය ගෙන ඇති ක්‍රියා මාර්ග 2ක් ලියන්න.

11 කොටස

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.)

(5) අ. පහත දැක්වෙන ස්වරූප වලට ගැලපෙන ගනුදෙනුව ලියා දක්වන්න.

i. ප්‍රාග්ධනය වැඩිවීම හා වත්කම් වැඩිවීම

ii. වගකීම් අඩුවීම හා වත්කම් අඩු වීම (ලකුණු 01)

ආ. ආපසු යැවුම් ජ'නලය ලිවීමට භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය නම් කර, භාණ්ඩ ආපසු යැවීමට හේතු 2ක් ලියන්න. (ලකුණු 01)

ඉ. i. ගිණුම්කරණයේදී දෝෂ ඇතිවන අවස්ථා වලට උදහරණ 2ක් ලියන්න. (ලකුණු 01)

ii. අවිනිශ්චිත ගිණුම හඳුන්වා, එය භාවිතා කරන අවස්ථා 2ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

iii. මයිකල්ගේ ව්‍යාපාරයේ 2008 මැයි 31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම සම නොවූ හෙයින් එම වෙනස අවිනිශ්චිත ගිණුමකට සටහන් කරන ලදී. පසුව සොයාගත් වැරදි මෙසේය.

a) ගෙවූ ලිපි ද්‍රව්‍ය ගාස්තු රු. 400 ක් ලිපිද්‍රව්‍ය ගිණුමේ සටහන් වී නොමැත.

b) ආපසු එවුම් ජ'නලයේ රු. 100 ක් අඩුවෙන් එකතු කර තිබිණි.

c) ප්‍රදීප්ට ගෙවූ රු. 600 ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වී ඇත.

d) ගෙවූ පොලී රු 300 ලැබූ පොලී ගිණුමේ බැරට සටහන් වී ඇත.

අවශ්‍ය වන්නේ,

අ. වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන්

ආ. අවිනිශ්චිත ගිණුම

06) සපුමල් "සළුපිළි" නමින් කමිස මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යයි. මාර්තු මාසයට කමිස 100/- ක් මැසූ ඔහු ඒ සඳහා අවශ්‍ය රෙදි වලට රු. 6000/- ක්ද, නූල් සඳහා රු. 500/- ක්ද, ඇසුරුම් වියදම් සඳහා රු. 700/- ක්ද වැය වී ඇත. මීට අමතරව ඔහුගේ යහළුවන් දෙදෙනෙකු වූ අමල් සහ කමල්ට කමිස මැසීම වෙනුවෙන් රු. 10,000/- ක් ගෙවීමට සිදුවිය. සුපරීක්ෂණ කටයුතු වෙනුවෙන් ඔහුගේ බිරිඳට රු. 6500/- ක් ගෙවන ලදී. තවද විදුලිය වෙනුවෙන් රු. 400/- ක්ද, රක්ෂණ ගාස්තු රු. 800/- ක්ද කර්මාන්ත ශාලා කුලී රු. 1200/- ක්ද ගෙවන ලදී. 2008 මාර්තු මාසයේ නිෂ්පාදන පිරිවැය මත 10% ක් ලාභයක් තබා ගැනීමට ඔහු තීරණය කරන ලදී.

2008 මාර්තු 01 වන දින ඉතිරි අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 1000/- ක් වූ බවත් 2008 මාර්තු 31 වන දින ඉතිරි අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 900/- ක්ද විය.

i. සපුමල් ගේ ව්‍යාපාරයේ පරිභෝජ්‍ය ද්‍රව්‍ය පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02)

ii. ප්‍රාථමික පිරිවැය (ලකුණු 02)

iii. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (ලකුණු 01)

iv. මුළු පිරිවැය (ලකුණු 01)

v. ඒකක පිරිවැය (ලකුණු 02)

vi. ඒකකයක විකුණුම් මිල (ලකුණු 02)

(07) සිසිල් ව්‍යාපාරයේ පොත් වලින් 2008.03.01 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	රු.	රු.
ගැණුම්	52,000	
විකුණුම්		88,000
ණයහිමි		5,000
ලී බඩු	8,000	
ඉඩම් හා ගොඩනැගිලි	70,000	
ආපසු එවුම්	1,000	
ආපසු යැවුම්		700
ගෙවල් කුලී	6,000	
සේවක වේතන	11,000	
අතැති මුදල්	2,000	
ගෙන ඒමේ කුලී	400	
බඩු තොගය(2007.04.01)	10,000	
ණයගැති	3,000	
රක්ෂණ ගාස්තු	800	
ප්‍රචාරණ	1,200	
ප්‍රවාහන වියදම්	600	
බැංකු ගාස්තු	200	
දුන් වට්ටම්	150	
ප්‍රාග්ධනය		73,150
වැටුප්	500	
	166,850	**166,850**

පහත සඳහන් තොරතුරු ද සැලකිල්ලට ගන්න.

i. 2008.03.31 දිනට බඩු තොගය රු. 4000/- කි.

ii. ගෙවිය යුතු රක්ෂණ ගාස්තු රු. 200/-

iii. ඉදිරියට ගෙවූ ප්‍රචාරණ ගාස්තු රු. 100/- අවශ්‍ය වන්නේ,

අ. 2008.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභා'ලාභ ගිණුම

ආ. 2008.03.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 10)